# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref.

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.

දිනය / திகதி / Date: 2020.06.01

## මාධ්‍ය නිවේදනය

### ජගත් පරිසර දිනය සැමරීමට මධ්‍යම පරිසර අධිකාරියෙන් විශේෂ වැඩසටහන්.....

2020 ජූනි මස 05වන දිනට යෙදෙන ජගත් පරිසර දිනය සැමරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් විශේෂ වැඩසටහන් කිහිපයක් සංවිධාන කරනු ලැබ ඇත. "ජෛව විවිධත්වය - සොබා දහමට ඉඩක්" යන තේමාව ඔස්සේ පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය මගින් මෙවර ජගත් පරිසර දිනය සැමරීම සඳහා සංවිධාන කළ වැඩසටහනට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරිය මෙම විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

මේ අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් රුක්රෝපණ ව්‍යාපෘතියක් සහ දීපව්‍යාප්ත ගීත රචනා හා ඡයාරූප තරඟයක් සංවිධාන කරනු ලැබ ඇති අතර කොරෝනා වසංගත කාලය තුළ කොළඹ නගරයේ පරිසර ස්වභාවය දැක්වෙන වීඩියෝ පටයක් නිර්මාණය කරනු ලැබ ඇත.

ජගත් පරිසර දිනය නිමිති කර ගනිමින් පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය තම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා එක්ව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි රුක්රෝපණ ව්‍යාපෘතියක් සංවිධාන කර ඇති අතර මේ යටතේ එක් එක් දිස්ත්‍රික්කයට අවේණික පළතුරු පැළ ප්‍රදේශයේ ආගමික ස්ථානවල සිටුවීම සිදු කරයි. එහිදී කෑගල්ල, මාතර සහ බදුල්ල යන දිස්ත්‍රික්ක තුනෙහි රුක්රෝපණ ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදුකරනු ලබයි. මේ අනුව මෙම දිස්ත්‍රික්කවල බෞද්ධ, හින්දු, කතෝලික සහ ඉස්ලාම් ආගමික ස්ථානයන්හි ජගත් පරිසර දිනයේදී මෙම පළතුරු පැළ සිටුවීමට කටයුතු යොදා ඇත.

"ශ්‍රී ලංකවේ අපූරු ජෛව විවිධත්වය" යන තේමාව ඔස්සේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් සංවිධාන කරනු ලැබූ දීපව්‍යාප්ත විවෘත ගීත රචනා සහ ඡායාරූප තරගය සඳහා දිවයිනේ නන් දෙසින් ගීත රචනා සහ ඡායාරූප විශාල ප්‍රමාණයක් ලැබුණු අතර මේවන විට අදාළ විනිශ්චය කටයුතු සිදු කරමින් පවතී. රටේ පවතින කාලීන තත්වයන් සැලකිල්ලට ගනිමින් මෙම තරගය පූර්ණ වශයෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමට කටයුතු කරන ලදී. අවසන් තරඟ ප්‍රතිඵල ජනමාධ්‍ය මගින් සහ මධ්‍යම පරිසර අධිකාරියේ www.cea.lk වෙබ් අඩවිය ඔස්සේ ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

කොරෝනා වසංගත කාලය තුළ කොළඹ නගරයේ පරිසර ස්වභාවය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරිය විසින් විනාඩි 10ක වීඩියෝ පටයක් නිෂ්පාදනය කරනු ලැබූ අතර ජගත් පරිසර දිනයේ දී ජගත් පරිසර දින ප්‍රධාන වැඩසටහන පැවැත්වෙන මිහින්තලේ පුදබිමේ දී එය අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත පිරිනැමීමට නියමිතය. මෙම අවස්ථාවට ඉඩම්, ඉඩම් සංවර්ධ, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍ය එස්. එම් චන්ද්‍රසේන මහතා, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතා ඇතුළු නිලධාරීන් සහභාගීවීමට නියමිතය.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0716566660, 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය